00001

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන අංශය

නීතිවේදී උපාධි පාඨමාලාව- 3 වන මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය 2 - 2022/2023

LLU3502 -සාධාරණත්වයේ මූලධර්ම

කාලය - පැය එකයි

දිනය - 01.12.2023 වේලාව - පෙ.ව 11.30 - ප.ව 12.30

**එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.**

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

1. ශාන්ත මහතාගේ අන්තිම කැමති පත්‍රයෙන් සිදු කළ පහත සඳහන් පැවරීම් මගින් වලංගු භාර නිර්මාණය වී ඇත්ද යන්න සාකච්ඡා කරන්න.

(අ) තම මවගේ සහ සොහොයුරියගේ යහපත වෙනුවෙන් යොදවනු ඇතැයි යන පූර්ණ විශ්වාසය ඇතිව රුපියල් මිලියන 2 ක් මගේ දහසය හැවිරිදි පුත් මහීෂට.

(ආ) තීරු බදු ගෙවීමෙන් තොරව ජංගම දුරකතන සහ පරිගණක උපාංග ආනයනය කිරීමේ අරමුණින් රුපියල් මිලියනයක් මගේ මිත්‍ර තිස්සට.

(ඇ) පවුලේ වඩාත්ම කැමති සාමාජිකයන් අතර බෙදා දෙනු ඇතැයි යන අපේක්ෂාවෙන් මගේ තේ වත්තෙන් කොටසක් මගේ බිරිඳ රමණිට.

(ඈ) මගේ ලැබ්‍රඩෝර් වර්ගයේ බල්ලන් දෙදෙනාගේ නිසි පරිස්සම සුරක්ෂිත කිරීම සඳහා රුපියල් 100000 ක් මගේ සහෝදරයා වූ සරත්ට.

(ලකුණු 5x4 = 20)

2 (අ) 'භාරය' යන්නෙහි අර්ථය පැහැදිලි කර භාර සංකල්පය හා පීත කොමිසම (*fideicommissum*) අතර වෙනස දක්වන්න.

(ලකුණු 10)

(ආ) නීතියේ හිඩැසක් (*casus omissus*) ඇති අවස්ථාවකදී භාර ආඥා පනතේ 2 වගන්තියේ අදාළත්වය සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුර අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ විනිශ්චිත නඩු තීරණ මගින් තහවුරු කළ යුතුය.

(ලකුණු 10)

*-හිමිකම් ඇවිරිණි-*